1980-10-15

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1980 අංක 27 දරන විලවුන්, උපකරණ සහ ඖෂධ පනත

[සහතිකය සටහන් කළේ 1980 ජූලි මස 17 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1980 සැප්තැම්බර් මස 19 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැක

මිල : රු. 1.55 යි

තැපැල් ගාස්තුව : ශත 75 යි

1980 අංක 27 දරන විලවුන්, උපකරණ සහ ඖෂධ පනත
[සහතිකය සටහන් කළේ 1980 ජූලි මස 17 වන දින]

එල්. ඩී.—ඕ. 61/78.

විලවුන්, උපකරණ සහ ඖෂධ නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම, විකිණීම සහ බෙදාහැරීම විධිමත් කිරීම හා පාලනය කිරීම සඳහා ද, විලවුන්, උපකරණ සහ ඖෂධ පිළිබඳ තාක්ෂණික උපදේශක කමිටුවක් පිහිටුවීම සඳහා ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම සඳහා ද වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1980 අංක 27 දරන විලවුන්, උපකරණ සහ ඖෂධ පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය. (ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.)

## I වන කොටස

### විලවුන්, උපකරණ සහ ඖෂධ සම්බන්ධයෙන් තහනම් කිරීම

2. (1) විලවුන්, උපකරණ සහ ඖෂධ අධිකාරිය විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් නොමැතිව කිසිම තැනැත්තකු විසින් විලවුන් කිසිවක් නිෂ්පාදනය කිරීම හෝ ආනයනය කිරීම හෝ නොකරනු ලැබිය යුතු ය. (විලවුන් නිෂ්පාදනය කිරීම ආදියට තැනැත්තන් සහ ස්ථාන සඳහා බලපත්‍ර දීම.)

(2) විලවුන්, උපකරණ සහ ඖෂධ අධිකාරිය විසින් යම් ස්ථානයක් සඳහා බලපත්‍රයක් නිකුත් කර ඇත්නම් මිස, කිසිම තැනැත්තකු විසින් ඒ ස්ථානයෙහි විලවුන් කිසිවක් නිෂ්පාදනය කිරීම, පිළියෙල කිරීම, ගබඩා කිරීම හෝ විකිණීම නොකරනු ලැබිය යුතු ය.

3. (1) කිසිම තැනැත්තකු විසින් සනීපාරක්ෂා රහිත තත්ත්වයන් යටතේ විලවුන් කිසිවක් නිෂ්පාදනය කිරීම, පිළියෙල කිරීම, ආරක්ෂා කිරීම, ඇසිරීම හෝ විකිණීම සඳහා ගබඩා කිරීම නොකරනු ලැබිය යුතු ය. (විලවුන් නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම, විකිණීම සහ බෙදාහැරීම පිළිබඳ තහනම් කිරීම.)

(2) කිසිම තැනැත්තකු විසින්—

(අ) සනීපාරක්ෂා රහිත තත්ත්වයන් යටතේ නිෂ්පාදනය කරන ලද, පිළියෙල කරන ලද, ආරක්ෂා කරන ලද, අසුරන ලද හෝ විකිණීම සඳහා ගබඩා කරන ලද විලවුන් කිසිවක් ;

(ආ) යම් අපවිත්‍ර හෝ නරක් වූ ද්‍රව්‍යයක් හෝ යම් බාහිර ද්‍රව්‍යයක් හෝ සම්පූර්ණ වශයෙන් හෝ කොටසක් වශයෙන් ඇත්තා වූ විලවුන් කිසිවක් ; හෝ

(ඇ) (i) විලවුන් සමඟ ඇති ලේබලයෙහි වූ උපදෙස් අනුව ; හෝ

(ii) ඒ විලවුන් පාවිච්චි කිරීමේ දී සිරිත් පරිදි නැතහොත් සාමාන්‍ය භාවිතය පරිදි වන්නා වූ යම් කාර්යයක් සඳහා සහ පාවිච්චි කිරීමේ ක්‍රම අනුව ; හෝ

ඒ විලවුන් පාවිච්චි කරනු ලබන විට, පාවිච්චි කරන්නාගේ සෞඛ්‍යයට හානිකර විය හැකි යම් ද්‍රව්‍යයක් එහි හෝ ඒ මත ඇති විලවුන් කිසිවක් හෝ

ආනයනය කිරීම, බෙදා හැරීම, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම හෝ විකිණීම නොකරනු ලැබිය යුතු ය.

විලවුන් සඳහා ප්‍රමිතිය නියමිත අවස්ථාවක.

4. විලවුන් කිසිවක් සඳහා ප්‍රමිතියක් නියම කර ඇති අවස්ථාවක, ඒ ප්‍රමිතිය නියම කරනු ලැබූ විලවුන් යයි වරදවා සැලකීමට ඉඩ ඇති ආකාරයෙන් ඒ ප්‍රමිතියට අනුකූල නොවන්නා වූ විලවුන් කිසිවක් ලේබල් කිරීම, ඇසිරීම, විකිණීම, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම හෝ බෙදා හැරීම කිසිම තැනැත්තකු විසින් නොකරනු ලැබිය යුතු ය.

උපකරණ නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම, විකිණීම සහ බෙදා හැරීම ආදිය පිළිබඳ තහනම් කිරීම.

5. (අ) යම් උපකරණයක් පාවිච්චි කිරීමේ දී සිරිත් පරිදි නැතහොත් සාමාන්‍ය භාවිතය පරිදි වන්නා වූ තත්ත්වයන් යටතේ ; හෝ

(ආ) යම් උපකරණයක් සමඟ ඇති ලේබලයෙහි වූ උපදෙස් අනුව ; හෝ

ඒ උපකරණය පාවිච්චි කරනු ලබන විට, පාවිච්චි කරන්නාගේ සෞඛ්‍යයට හානිකර විය හැක්කේ ද එවැනි උපකරණයක් කිසිම තැනැත්තකු විසින් නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම, විකිණීම, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම හෝ බෙදා හැරීම නොකරනු ලැබිය යුතු ය.

උපකරණ නිෂ්පාදනය කිරීම ආදිය සඳහා තැනැත්තන්ට බලපත්‍ර දීම.

6. විලවුන්, උපකරණ සහ ඖෂධ අධිකාරිය විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් නොමැතිව කිසිම තැනැත්තකු විසින් යම් උපකරණයක් නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම, විකිණීම, විකිණීමට ඉදිරිපත් කිරීම හෝ බෙදා හැරීම නොකරනු ලැබිය යුතු ය.

උපකරණ පිළිබඳ ලේබල් කිරීම, ඇසිරීම සහ ප්‍රචාරය කිරීම.

7. (1) ව්‍යාජ, නොමඟ යවන සුලු, මුලා කරන සුලු ආකාරයකින් හෝ උපකරණයක සංයුතිය, යෝග්‍යතාව හෝ ආරක්ෂා සහිත බව සම්බන්ධයෙන් වැරදි හැඟීමක් ඇති කිරීමට ඉඩ ඇති ආකාරයකින් යම් උපකරණයක් ලේබල් කිරීම, ඇසිරීම, කාර්යාවලියකට භාජන කිරීම, සකස් කිරීම, විකිණීම, බෙදා හැරීම, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම හෝ ප්‍රචාරය කිරීම කිසිම තැනැත්තකු විසින් නොකරනු ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ සාදන ලද නියෝගවලින් නියම කරන ලද පරිදි ලේබල් නොකරන ලද හෝ නොඅසුරන ලද හෝ ඒ නියෝගවලට පටහැණිව ලේබල් කරන ලද හෝ අසුරන ලද උපකරණයක් (1) වන උපවගන්තියට පටහැණිව ලේබල් කරනු ලැබූ ලෙස හෝ අසුරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

උපකරණ සඳහා ප්‍රමිතියක් නියමිත අවස්ථාවක.

8. උපකරණයක් සඳහා ප්‍රමිතියක් නියම කර ඇති අවස්ථාවක, ඒ ප්‍රමිතිය නියම කරනු ලැබූ උපකරණය යයි වරදවා සැලකීමට ඉඩ ඇති ආකාරයකින් එම ප්‍රමිතියට අනුකූල නොවන්නා වූ යම් උපකරණයක් ලේබල් කිරීම, ඇසිරීම, විකිණීම, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම, බෙදාහැරීම හෝ ප්‍රචාරය කිරීම කිසිම තැනැත්තකු විසින් නොකරනු ලැබිය යුතු ය.

9. (1) විලවුන්, උපකරණ සහ ඖෂධ අධිකාරිය විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් නොමැතිව, කිසිම තැනැත්තකු විසින් යම් ඖෂධයක් නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම, විකිණීම, බෙදා හැරීම හෝ විකිණීම සඳහා ඉදිරිපත් කිරීම නොකරනු ලැබිය යුතු ය.

ඖෂධ නිෂ්පාදනය කිරීම ආදියට තැනැත්තන් සහ ස්ථාන සඳහා බලපත්‍ර දීම.

(2) යම් ස්ථානයක් සඳහා විලවුන්, උපකරණ සහ ඖෂධ අධිකාරිය විසින් බලපත්‍රයක් දී ඇත්නම් මිස, කිසිම තැනැත්තකු විසින් ඒ ස්ථානයෙහි යම් ඖෂධයක් නිෂ්පාදනය කිරීම, පිළියෙළ කිරීම, ගබඩා කිරීම හෝ විකිණීම නොකරනු ලැබිය යුතු ය.

10. (1) යම් ඖෂධයක් සනීපාරක්ෂා රහිත තත්ත්වයන් යටතේ, හෝ බාල කරනු ලැබූ යම් ඖෂධයක් හෝ නිෂ්පාදනය කිරීම, පිළියෙළ කිරීම, ආරක්ෂා කිරීම, ඇසිරීම හෝ විකිණීම සඳහා ගබඩා කිරීම කිසිම තැනැත්තකු විසින් නොකරනු ලැබිය යුතු ය.

ඖෂධ නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම, විකිණීම හා බෙදා හැරීම පිළිබඳ තහනම් කිරීම.

(2) කිසිම තැනැත්තකු විසින්—

(අ) සනීපාරක්ෂා රහිත තත්ත්වයන් යටතේ නිෂ්පාදනය කරන ලද, පිළියෙල කරන ලද, ආරක්ෂා කරන ලද, අසුරන ලද හෝ විකිණීම සඳහා ගබඩා කරන ලද; හෝ

(ආ) බාල කරන ලද ; හෝ

යම් ඖෂධයක් ආනයනය කිරීම, විකිණීම, බෙදා හැරීම හෝ විකිණීම සඳහා ඉදිරිපත් කිරීම නොකරනු ලැබිය යුතු ය.

11. (1) ව්‍යාජ, නොමග යවන සුලු, මුලාකරන සුලු ආකාරයකින් හෝ යම් ඖෂධයක ස්වභාව, අගය, ශක්තිය, ගුණය, සංයුතිය, යෝග්‍යතාව හෝ ආරක්ෂා සහිත බව සම්බන්ධයෙන් වැරදි හැඟීමක් ඇති කිරීමට ඉඩ ඇති ආකාරයකින් හෝ යම් ඖෂධයක් ලේබල් කිරීම, ඇසිරීම, කාර්යාවලියකට භාජන කිරීම, සකස් කිරීම, විකිණීම, බෙදා හැරීම, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම හෝ ප්‍රචාරය කිරීම කිසිම තැනැත්තකු විසින් නොකරනු ලැබිය යුතු ය.

ඖෂධ ලේබල් කිරීම, ඇසිරීම සහ ප්‍රචාරය කිරීම.

(2) මේ පනත යටතේ සාදන ලද නියෝගවලින් නියම කරන ලද පරිදි ලේබල් නොකරන ලද හෝ නොඅසුරන ලද හෝ ඒ නියෝගවලට පටහැණිව ලේබල් කරන ලද හෝ අසුරන ලද හෝ ඖෂධයක් (1) වන උපවගන්තියට පටහැණිව ලේබල් කරනු ලැබූ ලෙස හෝ අසුරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

12. (1) ඖෂධයක් සඳහා ප්‍රමිතියක් නියම කර ඇති අවස්ථාවක, ඒ ප්‍රමිතිය නියම කරනු ලැබූ ඖෂධය යයි වරදවා සැලකීමට ඉඩ ඇති ආකාරයකින් ඒ ප්‍රමිතියට අනුකූල නොවන්නා වූ යම් ඖෂධයක් ලේබල් කිරීම, ඇසිරීම, විකිණීම, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම, බෙදා හැරීම හෝ ප්‍රචාරය කිරීම කිසිම තැනැත්තකු විසින් නොකරනු ලැබිය යුතු ය.

ප්‍රමිතියට අනුකූලව ලේබල් කිරීම ආදිය.

(2) ඖෂධයක් සඳහා ප්‍රමිතියක් නියම කරනු ලැබ නැති, එහෙත් 'අ' උපලේඛනයෙහි දක්වා ඇති යම් ප්‍රකාශනයක ඒ ඖෂධය සඳහා ප්‍රමිතියක් ඇතුළත්ව ඇති අවස්ථාවක, ඒ ප්‍රකාශනයෙහි

ඇතුළත් ප්‍රමිතිය අදාළ වන ඖෂධය යයි වරදවා සැලකීමට ඉඩ ඇති ආකාරයෙන් ඒ ප්‍රකාශනයෙහි ඇතුළත් ප්‍රමිතියට අනුකූල නොවන්නා වූ යම් ඖෂධයක් ලේබල් කිරීම, ඇසිරීම, විකිණීම, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම, බෙදා හැරීම හෝ ප්‍රචාරය කිරීම කිසිම තැනැත්තකු විසින් නොකරනු ලැබිය යුතු ය.

(3) ඖෂධයක් සඳහා ප්‍රමිතියක් නියම කරනු ලැබ නැති, හෝ 'අ' උපලේඛනයෙහි දක්වා ඇති යම් ප්‍රකාශනයක ඒ ඖෂධය සඳහා ප්‍රමිතියක් ඇතුළත් කරනු ලැබ නැති අවස්ථාවක ඒ ඖෂධය—

(අ) ඒ ඖෂධය සමඟ ඇති ලේබලයෙහි දක්වා ඇති ප්‍රමිතියට අනුකූල නම් මිස ; නැතහොත්

(ආ) ප්‍රමිතියක් නියම කරන ලද ඖෂධයක් යයි හෝ 'අ' උපලේඛනයෙහි දක්වා ඇති යම් ප්‍රකාශනයක ඇතුළත් ප්‍රමිතියක් අදාළ වන ඖෂධයක් යයි වරදවා සැලකීමට ඉඩ ඇති ආකාරයකින්

කිසිම තැනැත්තකු විසින් විකිණීම, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම හෝ බෙදා හැරීම නොකරනු ලැබිය යුතු ය.

නිෂ්පාදන ස්ථානය සහ කාර්යාවලිය අනුමත කරනු ලැබ ඇත්නම් මිස, ඇතැම් ඖෂධ විකිණීම තහනම් බව.

13. 'ආ' උපලේඛනයෙහි හෝ 'ඇ' උපලේඛනයෙහි විස්තර කරන ලද යම් ඖෂධයක් ඒ ඖෂධය නිෂ්පාදනය කළ ස්ථානය සහ ඒ ඖෂධය නිෂ්පාදනය කිරීමේ කාර්යාවලිය සහ තත්ත්වයන්, ඒ ඖෂධය පාවිච්චි කිරීම සඳහා ආරක්ෂා සහිත වන බව සහතික කෙරෙන සේ සුදුසු වන්නේ යයි නියමිත ආකෘතිය සහ ආකාරය අනුව අනුමත කරනු ලැබ ඇත්නම් මිස, කිසිම තැනැත්තකු විසින් විකිණීම, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම හෝ බෙදා හැරීම නොකරනු ලැබිය යුතු ය.

ඖෂධ ගනු ලබන සුමුව විශ්වාස කළ හැකි බවට අනුමත කරනු ලබන්නේ නම් මිස, ඇතැම් ඖෂධ විකිණීම තහනම් බව.

14. 'ඇ' උපලේඛනයෙහි විස්තර කරන ලද යම් ඖෂධයක්, ඒ ඖෂධය ගනු ලැබුවේ යම් සුමුවකින් ද ඒ සුමුව පාවිච්චි කිරීම සඳහා විශ්වාස කළ හැකි බවට නියමිත ආකෘතියෙහි සහ ආකාරයෙන් අනුමත කරනු ලැබ ඇත්නම් මිස, කිසිම තැනැත්තකු විසින් විකිණීම, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම හෝ බෙදා හැරීම නොකරනු ලැබිය යුතු ය.

සැම්පල් බෙදා හැරීම තහනම් බව.

15. කිසිම තැනැත්තකු විසින් යම් ඖෂධයක් සැම්පලයක් වශයෙන් බෙදා හැරීම හෝ බෙදා හැරීමට සැලැස්වීම හෝ නොකරනු ලැබිය යුතු ය:

එසේ වුව ද වෛද්‍ය වෘත්තිකයකුට, දන්ත වෛද්‍යවරයකුට හෝ පශු වෛද්‍යවරයකුට ඖෂධයක යම් සැම්පලයක් නියමිත තත්ත්වයන් යටතේ බෙදා හැරීම කෙරෙහි මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

ඇතැම් ඖෂධ විකිණීම සම්පූර්ණයෙන් තහනම් බව.

16. 'ඉ' උපලේඛනයෙහි විස්තර කරන ලද යම් ඖෂධයක් කිසිම තැනැත්තකු විසින් විකිණීම, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම හෝ බෙදා හැරීම නොකරනු ලැබිය යුතු ය.

**17.** (1) යම් විලවුන් කිසිවක්, උපකරණයක් හෝ ඖෂධයක් 'ඊ' උපලේඛනයෙහි දක්වා ඇති යම් රෝග, ආබාධ, හෝ අසාමාන්‍ය කායික තත්ත්වයන් සඳහා ප්‍රතිකාරයක්, නිවාරණයක් හෝ සුවයක් වශයෙන් කිසිම තැනැත්තකු විසින් මහජනයා වෙත ප්‍රචාරය නොකරනු ලැබිය යුතු ය.

ඇතැම් රෝග සඳහා ප්‍රතිකාර වශයෙන් විලවුන්, උපකරණ සහ ඖෂධ ප්‍රචාරය කිරීම, ආනයනය කිරීම, විකිණීම සහ බෙදා හැරීම තහනම් බව.

(2) 'ඊ' උපලේඛනයෙහි දක්වා ඇති යම් රෝග, ආබාධ හෝ අසාමාන්‍ය කායික තත්ත්වයන් සඳහා ප්‍රතිකාරයක්, නිවාරණයක් හෝ සුවයක් වශයෙන්—

(අ) ලේබලයකින් ප්‍රකාශ කරන ලද; හෝ

(ආ) මහජනයා වෙත ප්‍රචාරය කරන ලද; හෝ

යම් විලවුන් කිසිවක්, උපකරණයක් හෝ ඖෂධයක් කිසිම තැනැත්තකු විසින් ආනයනය කිරීම, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම හෝ බෙදා හැරීම නොකරනු ලැබිය යුතු ය.

## II වන කොටස

### පරිපාලනය

**18.** (1) (මෙහි මින් මතු "කමිටුව" යනුවෙන් සඳහන් කරනු ලබන) විලවුන්, උපකරණ සහ ඖෂධ පිළිබඳ තාක්ෂණික උපදේශක කමිටුව යනුවෙන් හඳුන්වනු ලබන, පහත දැක්වෙන තැනැත්තන් ගෙන් සමන්විත කමිටුවක් විය යුතු ය:—

විලවුන්, උපකරණ සහ ඖෂධ පිළිබඳ තාක්ෂණික උපදේශක කමිටුව.

(අ) සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා (ඔහු කමිටුවේ සභාපතිවරයා විය යුතු ය.);

(ආ) විලවුන්, උපකරණ සහ ඖෂධ පාලනයේ පරිපාලනය භාර සහකාර සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා (ඔහු කමිටුවේ ලේකම්වරයා විය යුතු ය.);

(ඇ) කොළඹ විශ්ව විද්‍යාලයේ, භිෂග්වේදය පිළිබඳ මහාචාර්ය වරයා;

(ඈ) වෛද්‍ය පර්යේෂණ ආයතනයේ භිෂග්වේදී;

(ඉ) රාජ්‍ය ඖෂධ සංස්ථාවේ සභාපතිවරයා;

(ඊ) රජයේ වෛද්‍ය ගබඩාවේ අධිකාරිවරයා;

(උ) රජයේ රස පරීක්ෂකවරයා හෝ ඔහු විසින් නම් කරන ලද යම් නිලධරයෙක්;

(ඌ) ඖෂධ තත්ත්ව පාලන පරීක්ෂණාගාරය භාර නිලධරයා;

(එ) අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන උපදේශක වෛද්‍යවර යෙක්;

(ඒ) අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන උපදේශක ශල්‍ය වෛද්‍යවරයෙක්;

(ඔ) ඖෂධ නිෂ්පාදකයන්ගේ සංගමය විසින් නම් කරනු ලබන ඒ සංගමයේ නියෝජිතයෙක්;

(ඕ) කර්මාන්ත විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, ලංකා ප්‍රමිති කාර්යාංශයේ නියෝජිතයෙක් ;

(ක) ශ්‍රී ලංකා ඖෂධ සමාජය විසින් නම් කරනු ලබන ඒ සමාජයේ නියෝජිතයෙක් ;

(ග) ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය විසින් නම් කරනු ලබන ඒ සංගම යේ නියෝජිතයෙක් ; සහ

(ච) ස්වාධීන වෛද්‍ය වෘත්තිකයන්ගේ සංගමය විසින් නම් කරනු ලබන ඒ සංගමයේ නියෝජිතයෙක්.

(2) (1) වන උපවගන්තියේ (එ), (ඒ), (ඔ), (ඕ), (ක), (ග) හෝ (ච) ඡේදයන් යටතේ නම් කරනු ලබන සෑම කමිටු සාමාජික යකු ම, ඉල්ලා අස්වීමෙන්, මරණය සිදුවීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් තම ධුරය කලින් හිස් කරන්නේ නම් මිස, නම් කරනු ලබන දින සිට අවුරුදු තුනක කාලයක් සඳහා ධුරය දැරිය යුතු අතර, නැවත නම් කරනු ලැබීමට සුදුස්සකු විය යුතු ය.

(3) (2) වන උපවගන්තියෙහි සඳහන් කර ඇති සාමාජිකයන් හැර කමිටුවේ සෑම සාමාජිකයකු ම කමිටුවේ සාමාජිකයකු වීමට සුදුසුකම් ලැබුවේ යම් ධුරයක් දැරීම නිසා ද, ඔහු ඒ ධුරය දැරීම අවසන් වූ විට, කමිටුවේ සාමාජිකයකු වීම අවසන් විය යුතු ය.

(4) කමිටුවේ සාමාජිකයන් පිළිබඳ යම් පුරප්පාඩුවක් තිබුණ ද කමිටුව විසින් ස්වකීය කර්තව්‍ය ඉටු කරනු ලැබිය හැකි ය.

(5) කමිටුවේ යම් රැස්වීමක ගණපූරණය කමිටුවේ සාමාජිකයන් පස්දෙනකු විය යුතු ය.

(6) මේ පනතේ විධිවිධානවලට යටත්ව, ස්වකීය රැස්වීම් සහ රැස්වීම්වල දී කටයුතු කිරීම පිළිබඳ කාර්ය පටිපාටිය කමිටුව විසින් පාලනය කරනු ලැබිය හැකි ය.

කමිටුවේ කාර්ය.

19. (1) මේ පනත ක්‍රියාත්මක කිරීමේ දී උද්ගත වන කරුණු පිළිබඳව අමාත්‍යවරයාට උපදෙස් දීම සහ මේ පනත යටතේ තමන්ට පවරනු ලබන වෙනත් කර්තව්‍ය කිරීම කමිටුවේ කාර්ය විය යුතු ය.

(2) කමිටුව විසින් පවරනු ලබන යම් බලතල හෝ කාර්ය කමිටුව විසින් නියම කරනු ලබන යම් කොන්දේසි වෙතොත් ඒවාට යටත් ව, ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම සඳහා සුදුසු යයි කමිටුව විසින් සලකනු ලබන උප කමිටු, කමිටුව විසින් පත් කරනු ලැබිය හැකි ය. තවද, මෙම උප කමිටුවලට කමිටුවේ සාමාජිකයන් නොවන තැනැත්තන් පත් කරනු ලැබිය හැකි ය.

විලවුන්, උපකරණ සහ ඖෂධ අධිකාරිය.

20. (1) මේ පනතේ කාර්ය සඳහා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා, (මෙහි මින් මතු "අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන) විලවුන්, උපකරණ සහ ඖෂධ අධිකාරිය විය යුතු ය.

(2) සෑම ඖෂධයක් ම අධිකාරිය වෙත ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.

(3) අමාත්‍යවරයාගේ අනුමතිය ඇතිව, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා විසින්, මේ පනත යටතේ අධිකාරිය වශයෙන් වූ තමාගේ සියලු බලතල හෝ ඉන් කිසිවක් යම් තැනැත්තකුට නමින් හෝ ධුරයෙන් පවරනු ලැබිය හැකි ය.

21. (1) මේ පනතේ කාර්ය සඳහා බලයලත් නිලධරයකු වශයෙන් යම් සෞඛ්‍ය සේවා අධිකාරිවරයකු, යම් සෞඛ්‍ය වෛද්‍ය නිලධරයකු, යම් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයකු, යම් ආහාර හා ඖෂධ පරීක්ෂකවරයකු සහ යම් ඖෂධ පරීක්ෂකවරයකු අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබිය හැකි ය. බලයලත් නිලධරයෝ.

(2) සෑම බලයලත් නිලධරයකු විසින් ම, මේ පනත යටතේ තම කර්තව්‍ය කිරීමේ කාර්ය සඳහා, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත ප්‍රකාර පොලිස් නිලධරයකුගේ බලතල ක්‍රියාත්මක කළ යුතු ය.

22. (1) තම කාර්ය ඉටු කිරීම සහ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා බලයලත් නිලධරයකු විසින්— බලයලත් නිලධරයන්ගේ බලතල.

(අ) යම් භාණ්ඩයක් නිෂ්පාදනය කරනු ලබන, පිළියෙල කරනු ලබන, අසුරනු ලබන, ආරක්ෂා කරනු ලබන හෝ ගබඩා කරනු ලබන ස්ථානයක් යයි තමා විශ්වාස කරන යම් ස්ථානයකට යම් සාධාරණ වේලාවක දී ඇතුළුවීම ද එවැනි යම් භාණ්ඩයක් පරීක්ෂා කිරීම ද එහි සැම්පල් ගැනීම ද කරනු ලැබිය හැකි ය. තවද, ඒ භාණ්ඩය නිෂ්පාදනය කිරීම, පිළියෙල කිරීම, ආරක්ෂා කිරීම, ඇසිරීම හෝ ගබඩා කිරීම සඳහා පාවිච්චි කරනු ලබන්නේ යයි තමා විශ්වාස කරන යම් දෙයක් පරීක්ෂා කරනු ලැබිය හැකි ය;

(ආ) යම් භාණ්ඩයක් අඩංගු වන්නකැයි තමා විශ්වාස කරන යම් භාජනයක් හෝ ඇසුරුමක් හෝ විවෘත කොට පරීක්ෂා කරනු ලැබිය හැකි ය;

(ඇ) බලයලත් නිලධරයා සෞඛ්‍ය සේවා අධිකාරිවරයකු හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධරයකු හෝ වන අවස්ථාවක, යම් භාණ්ඩයක් සම්බන්ධයෙන්, මේ පනත ක්‍රියාත්මක කිරීමට හෝ බලාත්මක කිරීමට අදාළ යම් තොරතුරක් ඇතුළත් බවට තමා විශ්වාස කරන (අ) ඡේදයෙහි සඳහන් යම් ස්ථානයක ඇති යම් පොත්, ලේඛන හෝ වෙනත් වාර්තා පරීක්ෂා කරනු ලැබිය හැකි අතර, ඒවායේ පිටපත් සෑදීම හෝ ඒවායින් උධෘත ගැනීම කරනු ලැබිය හැකි ය; තව ද

(ඈ) මේ පනතේ හෝ මේ පනත යටතේ සාදන ලද නියෝගයක යම් විධිවිධානයක් කඩ කරනු ලැබුවේ හෝ උල්ලංඝනය කරනු ලැබුවේ යම් භාණ්ඩයක් මගින් හෝ යම් භාණ්ඩයක් සම්බන්ධයෙන් යයි තමා විශ්වාස කරන්නේ ද ඒ භාණ්ඩය, අවශ්‍ය යම් කාලයක් සඳහා තහනමට ගෙන රඳවා ගත හැකි ය.

(2) මේ වගන්තියේ සහ 23 වන වගන්තියේ කාර්ය සඳහා "භාණ්ඩය" යන්නෙන්—

(අ) යම් විලවුන් කිසිවක්, උපකරණයක් හෝ ඖෂධයක් ;

(ආ) යම් විලවුන් කිසිවක්, උපකරණයක් හෝ ඖෂධයක් නිෂ්පාදනය කිරීම, පිළියෙල කිරීම, ආරක්ෂා කිරීම, ඇසිරීම හෝ ගබඩා කිරීම සඳහා පාවිච්චි කරනු ලබන හෝ පාවිච්චි කරනු ලැබිය හැකි යම් දෙයක් ; සහ

(ඇ) යම් ලේබල් කිරීමේ හෝ ප්‍රචාරය කිරීමේ ද්‍රව්‍යයක්

අදහස් වේ.

(3) ස්වකීය අධිකාරය ඉදිරිපත් කරන ලෙස මේ වගන්තිය යටතේ ක්‍රියා කරන බලයලත් නිලධරයකුට නියම කරනු ලැබුව හොත් ඔහු තම අධිකාරය ඉදිරිපත් කළ යුතු ය.

(4) (1) වන උපවගන්තිය ප්‍රකාර බලයලත් නිලධරයකු ඇතුළු වූ ස්ථානයක අයිතිකරු හෝ ඒ ස්ථානය භාර තැනැත්තා සහ එහි සිටින සෑම තැනැත්තකු විසින් ම තම බලය අනුව දිය හැකි සියලු සාධාරණ සහාය බලයලත් නිලධරයාට දිය යුතු අතර, ඔහු විසින් නියම කරනු ලබන තොරතුරු සහ සැම්පල් ඔහුට සැපයිය යුතු ය.

(5) මේ පනත හෝ ඒ යටතේ සාදන ලද නියෝග යටතේ තම බලතල ක්‍රියාත්මක කරමින් ක්‍රියා කරන යම් බලයලත් නිලධරයකුට කිසිම තැනැත්තකු විසින් බාධා නොපැමිණවිය යුතු ය.

(6) විකිණීම සඳහා තබා ඇති යම් විලවුන් කිසිවක, උපකරණයක හෝ ඖෂධයක සැම්පල් ලබා ගැනීමට බලයලත් නිලධරයකු විසින් ඉල්ලුම් කරනු ලබන්නේ නම් සහ ඒ විලවුන්, උපකරණය හෝ ඖෂධය විකිණීම සඳහා තබා ඇති තැනැත්තා බලයලත් නිලධරයාට වුවමනා කරනු ලබන යම් ප්‍රමාණයක් බලයලත් නිලධරයාට විකිණීම ප්‍රතික්ෂේප කරන්නේ නම් හෝ සැම්පල් වශයෙන් ගැනීමට තමාට බලය දෙනු ලැබූ ප්‍රමාණය ගැනීමට ඒ නිලධරයාට ඉඩදීම ප්‍රතික්ෂේප කරන්නේ නම්, හෝ එසේ ප්‍රතික්ෂේප කරන තැනැත්තා (5) වන උපවගන්තියේ කාර්ය සඳහා බලයලත් නිලධරයකුට බාධා කළ ලෙස සලකනු ලැබිය යුතු ය.

(7) මේ පනත හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝග යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමෙහි යෙදෙන යම් බලයලත් නිලධරයකු වෙත අසත්‍ය හෝ නොමඟ යවන සුලු ප්‍රකාශයක්, දැන දැන ම වාචික ව හෝ ලිඛිත ව කිසිම තැනැත්තකු විසින් නොකරනු ලැබිය යුතු ය.

(8) මේ පනත යටතේ බලයලත් නිලධරයකු විසින් තහනමට ගනු ලැබූ යම් භාණ්ඩයක් බලයලත් නිලධරයාගේ බලය නොමැතිව යම් ආකාරයකින් ඉවත් කිරීම හෝ වෙනස් කිරීම හෝ ඊට නොනිසි ලෙස අත ගැසීම හෝ අන්‍යාකාරයෙන් මැදිහත් වීම කිසිම තැනැත්තකු විසින් නොකරනු ලැබිය යුතු ය.

(9) මේ පනත යටතේ තහනමට ගනු ලැබූ යම් භාණ්ඩයක්, එය තහනමට ගන්නා ලද්දේ යම් ගොඩනැගිල්ලක දී හෝ ස්ථානයක දී ද බලයලත් නිලධරයාගේ කැමැත්ත පරිදි එම ගොඩනැගිල්ලේ හෝ ස්ථානයේ තැබීම හෝ ගබඩා කිරීම නැතහොත් ඔහුගේ අභිමතය පරිදි වෙනත් යම් ස්ථානයකට ඉවත් කිරීම කරනු ලැබිය හැකි ය.

(10) මේ පනත යටතේ කරන ලද යම් තහනමට ගැනීමක් පිළිබඳව, බලයලත් නිලධරයකු විසින් වහාම අධිකාරිය වෙත දන්වනු ලැබිය යුතු ය.

තහනමට ගනු ලැබූ භාණ්ඩ සම්බන්ධයෙන් ක්‍රියා පටිපාටිය.

23. (1) යම් භාණ්ඩයක් සම්බන්ධයෙන් වරදක් කරනු ලැබ ඒ භාණ්ඩය බලයලත් නිලධරයකු විසින් මේ පනත යටතේ තහනමට ගනු ලැබූ අවස්ථාවක, මේ පනතේ විධිවිධාන අතුරින් කිසිවක් හෝ මේ පනත යටතේ සාදන ලද නියෝග අතුරින් කිසිවක් උල්ලංඝනය කර ඇති බවට හෝ කඩකර ඇති බවට අධිකාරිය සෑහීමට පත්වන, සහ එම භාණ්ඩය විනාශ කිරීමට එම භාණ්ඩයේ අයිතිකරු හෝ එම භාණ්ඩය තහනමට ගනු ලැබූ අවස්ථාවේ දී එහි සන්තකය දරූ තැනැත්තා හෝ ලියවිල්ලකින් කැමැත්ත දක්වන විටෙක, අධිකාරිය විසින් විධාන කරනු ලැබිය හැකි පරිදි එම භාණ්ඩය විනාශ කිරීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම කරනු ලැබිය හැකි ය.

(2) ඒ භාණ්ඩයේ අයිතිකරු හෝ සන්තකය දරූ තැනැත්තා ඒ භාණ්ඩය විනාශ කිරීමට ලියවිල්ලකින් කැමැත්ත නොදෙන අවස්ථාවක, අධිකාරිය විසින්—

(අ) ඒ භාණ්ඩය සම්බන්ධයෙන් වූ මේ පනතේ හෝ පනත යටතේ සාදන ලද නියෝගවල විධිවිධාන උල්ලංඝනය කර හෝ කඩකර නැති බවට අධිකාරිය සෑහීමට පත් වන්නේ නම් ඒ භාණ්ඩය මුදා හරිනු ලැබිය යුතු ය; නැතහොත්

(ආ) මේ පනතේ හෝ පනත යටතේ සාදන ලද නියෝගවල විධිවිධාන කිසිවක් උල්ලංඝනය කිරීමක් හෝ කඩ කිරීමක් කරනු ලැබ ඇතැයි අධිකාරිය සෑහීමට පත් වන අවස්ථාවක, වහාම භාණ්ඩයේ ඒ අයිතිකරු හෝ සන්තකය දරූ තැනැත්තා වෙත දැන්වීමක් කර ඒ වරද කරන ලද්දේ යම් භාණ්ඩයක් සම්බන්ධයෙන් ද ඒ භාණ්ඩය තහනමට ගැනීම, ඒ වරද කරනු ලැබූ ප්‍රදේශය පිළිබඳ අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත් අධිකරණය වෙත දන්වනු ලැබිය යුතු ය.

(3) (2) (ආ) උපවගන්තිය යටතේ අධිකරණය වෙත කරුණු දන්වනු ලැබූ විට, ඒ අධිකරණය විසින්—

(අ) භාණ්ඩයේ අයිතිකරු හෝ එහි සන්තකය දරූ තැනැත්තා මේ පනතේ හෝ මේ පනත යටතේ සාදන ලද නියෝගවල විධිවිධාන උල්ලංඝනය කර හෝ කඩකර ඇති බවට, නඩු විභාගයෙන් පසුව අධිකරණය තීරණය කරන්නේ නම්, ඒ භාණ්ඩය අධිකරණය විසින් විධාන කරනු ලැබිය හැකි පරිදි බැහැර කිරීම සඳහා අධිකාරිය වෙත සතු කළ යුතු යයි ආඥා කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද වැරදිකරු හඳුනාගැනීමට හෝ සොයා ගැනීමට නොහැකි අවස්ථාවක, ඒ උල්ලංඝනය කිරීම හෝ කඩ කිරීම සම්බන්ධයෙන් නඩු පැවරීමක් නොමැතිව, ඒ භාණ්ඩය අධිකාරිය වෙත සතු කළ යුතු ය; නැතහොත්

(ආ) නඩු විභාගයෙන් පසුව, ඒ භාණ්ඩයේ අයිතිකරු හෝ සන්තකය දරූ තැනැත්තා මේ පනතේ හෝ මේ පනත යටතේ සාදන ලද නියෝගවල විධිවිධාන කිසිවක් උල්ලංඝනය කිරීම හෝ කඩ කිරීම පිළිබඳව වරදකරු නොවන්නේ යයි අධිකරණය තීරණය කරන්නේ නම් ඒ අයිතිකරුට හෝ සන්තකය දරූ තැනැත්තාට ඒ භාණ්ඩය මුදා හැරිය යුතු යයි ආඥා කරනු ලැබිය යුතු ය.

විශ්ලේෂණය.

**24.** (1) යම් බලයලත් නිලධරයකු විසින් තහනමට ගනු ලැබූ විලවුන්, උපකරණ හෝ ඖෂධ කිසිවක් හෝ ඉන් යම් කොටසක් හෝ ඔහු විසින් ගන්නා ලද යම් සැම්පලයක් හෝ, 23 (1) වන වගන්තිය යටතේ විනාශ කරනු ලැබුවහොත් මිස, අනුමත කරන ලද විශ්ලේෂකයකු වෙත විශ්ලේෂණය හෝ පරීක්ෂණය සඳහා ඔහු විසින් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ තමා වෙත ඉදිරිපත් කරන ලද විලවුන්, උපකරණ හෝ ඖෂධ කිසිවක විශ්ලේෂණයක් හෝ පරීක්ෂණයක් අනුමත කරන ලද විශ්ලේෂකයකු විසින් කරනු ලැබ ඇති අවස්ථාවක, ඔහුගේ පරීක්ෂණයේ හෝ විශ්ලේෂණයේ ප්‍රතිඵල දක්වෙන සහතිකයක් හෝ වාර්තාවක්, ඔහු විසින් අධිකාරිය වෙත නිකුත් කරනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තියේ කාර්ය සඳහා අනුමත කරන ලද විශ්ලේෂක යකු යන්නට අතිරේක අනුමත කරන ලද විශ්ලේෂකයකු ද ඇතුළත් වේ.

අනුමත කරන ලද විශ්ලේෂක.

**25.** (1) මේ පනතේ හෝ මේ පනත යටතේ සාදන ලද නියෝග වල කාර්ය සඳහා ආණ්ඩුවේ රස පරීක්ෂකවරයා අනුමත කරන ලද විශ්ලේෂක විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් ව ඇත ද, අමාත්‍යවරයා විසින් යම් තැනැත්තකු අතිරේක අනුමත කරන ලද විශ්ලේෂකයකු වශයෙන් අනුමත කරනු ලැබිය හැකි ය. අනුමතය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

(3) කිසිම තැනැත්තකු,—

(අ) නියමිත සුදුසුකම් ඔහු සතුව නොමැති නම්; හෝ

(ආ) විලවුන්, උපකරණ හෝ ඖෂධ නිෂ්පාදනය කිරීමට, ආනයනය කිරීමට, විකිණීමට හෝ බෙදාහැරීමට සම්බන්ධ යම් කර්මාන්තයක හෝ වෙළෙඳ ව්‍යාපාරයක කෙලින් ම හෝ අනියම් ලෙස ඔහු නිරතව සිටී නම් හෝ

අතිරේක අනුමත කරන ලද විශ්ලේෂකයකු වශයෙන් අනුමත නොකරනු ලැබිය යුතු ය.

## III වන කොටස

### නීති කෘත්‍ය

වැරදි.

**26.** (1) මේ පනතේ හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක හෝ විධිවිධාන කිසිවක් උල්ලංඝනය කරන හෝ කඩ කරන තැනහොත් මේ පනත යටතේ දෙන ලද යම් විධානයක් අනුව කටයුතු කිරීම පැහැර හරින සෑම තැනැත්තෙක් ම වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබූ විට—

(අ) වරදෙහි ස්වභාවය අනුව ඉන් මහජන සෞඛ්‍යයට හානි සිදු වේ නම්, රුපියල් පන් දහසක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු තුනක් නොඉක්මවන කාලයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකට ම හෝ යටත් විය යුතු ය;

(ආ) වෙනත් යම් වරදක් සඳහා වන විට—

(i) පළමු වරදට රුපියල් දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස තුනක් නොඉක්මවන කාලයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකට ම ද;

(ii) දෙවන හෝ තදනන්තර වරදකට රුපියල් දෙදහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකට ම

යටත් විය යුතු ය.

(2) මේ පනත හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ යටතේ වූ වරදකට වරදකරු කරනු ලැබූ තැනැත්තකු, මේ පනත හෝ ඒ යටතේ සාදන ලද නියෝගයක් යටතේ වූ එබඳුම හෝ සමාන ස්වභාවයේ දෙවන හෝ තදනන්තර වරදකට වරදකරු කරනු ලැබූ අවස්ථාවක, දෙවන හෝ තදනන්තර වරද සඳහා ඔහු වරදකරු කරන අධිකරණය විසින්—

(අ) වරදකරු කරනු ලැබූ තැනැත්තාගේ නම හා ලිපිනය ද වරද හා ඒ වරදට නියම කරන ලද දඬුවම ද අධිකරණය විසින් විධාන කළ හැකි යම් ප්‍රවෘත්ති පත්‍රයක හෝ වෙනත් යම් ආකාරයකින් පළ කරනු ලැබීමට සැලැස්විය හැකිය; තවද පළ කිරීමේ වියදම, වරදකරු කරනු ලැබූ තැනැත්තා වෙත නියම කරන ලද දඩයක් වූවාක් මෙන් ඔහුගෙන් අයකර ගනු ලැබිය හැකි ය;

(ආ) මේ පනත හෝ වෙනත් යම් නීතියක් යටතේ විලවුන්, උපකරණ හෝ ඖෂධ කිසිවක් නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම, විකිණීම හා බෙදා හැරීම සඳහා විත්තිකරු වෙත නිකුත් කරන ලද යම් බලපත්‍රයක් අවලංගු කිරීම හා ඒ බව අදාළ බලපත්‍ර අධිකාරිය වෙත දැන්වීම කරනු ලැබිය හැකි ය.

27. මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ වූ වරදක් කරන සෑම තැනැත්තකුම වරෙන්තුවක් නොමැතිව සිරභාරයට ගනු ලැබිය හැකි අතර, මේ පනත හෝ ඒ යටතේ සාදන ලද නියෝගයක් යටතේ වූ සෑම වරදක් ම මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් විනිශ්චය කරනු ලැබිය යුතු ය.

වරදක් කරන තැනැත්තකු වරෙන්තුවක් නොමැතිව සිරභාරයට ගත හැකි බව හා මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් විනිශ්චය කළ හැකි බව.

28. මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ වූ වරදක් සඳහා—

නඩු පැවරීම.

(අ) බලයලත් නිලධරයකු විසින් හැර; සහ

(ආ) එම වරද අනාවරණය කරනු ලැබූ දින සිට මාස තුනක කාලය ඉකුත් වීමෙන් පසුව

නඩු පැවරීමක් නොකරනු ලැබිය යුතු ය.

වෙනත් තැනැත්තකු වරදට වරදකරු බව විත්තිකරු ඔප්පු කරන අවස්ථාවක.

29. (1) (මෙහි මින් මතු "විත්තිකරු" යනුවෙන් සඳහන් කරනු ලබන) තැනැත්තකු මේ පනත යටතේ වූ වරදකට චෝදනා ලැබ සිටින අවස්ථාවක, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 136 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව ඔහු විසින් නිසි පරිදි පැමිණිල්ලක් කරනු ලැබූ විට හා තමාගේ අදහස පිළිබඳව දින තුනකට නොඅඩු දැනුම්දීමක් පැමිණිලි පක්ෂය වෙත කරනු ලැබූ විට, සැබෑ වරදකරු යයි තමා චෝදනා කරන වෙනත් යම් තැනැත්තකු අධිකරණය ඉදිරියට පමුණුවා ගැනීමට ඔහුට හිමිකම තිබිය යුතු අතර, වරද කිරීම ඔප්පු කරනු ලැබීමෙන් පසුව, වරද කිරීම ඒ වෙනත් යම් තැනැත්තාගේ ක්‍රියාවක් හෝ පැහැර හැරීමක් නිසා සිදු වූවකැයි අධිකරණය සෑහීමට පත් වන පරිදි විත්තිකරු ඔප්පු කරතහොත්, ඒ වෙනත් යම් තැනැත්තා වරදට වරදකරු කරනු ලැබිය හැකි ය. තව ද, තමා මේ පනතේ විධිවිධාන බලාත්මක කිරීම සඳහා නිසි සියලු උද්යෝගයෙන් ක්‍රියා කර ඇති බව ද විත්තිකරු ඔප්පු කරතහොත් ඔහු වරදින් නිදොස් කරනු ලැබිය යුතු ය.

(2) විත්තිකරු (1) වන උපවගන්තියේ විධිවිධාන ආධාර කර ගැනීමට ක්‍රියා කරන අවස්ථාවක—

(අ) විත්තිකරු සාක්ෂි දෙන්නේ නම් ඔහුගෙන් හා ඔහුගේ උත්තරවාද සනාථ කිරීම් වස් ඔහු විසින් කැඳවනු ලබන යම් සාක්ෂිකරුවන්ගෙන් හරස් ප්‍රශ්න ඇසීමේ හා බිඳ හෙළීමේ සාක්ෂි කැඳවීමේ අයිතිය පැමිණිලි පක්ෂයට මෙන්ම සැබෑ වරදකරු යයි විත්තිකරු චෝදනා නගන තැනැත්තාට ද ඇත්තේ ය;

(ආ) නීති කෘත්‍යවල යම් පාර්ශ්වයක් විසින් වෙනත් යම් පාර්ශ්වයක් වෙත නඩු ගාස්තු ගෙවීම සඳහා අධිකරණය විසින් සුදුසු යයි සිතන යම් ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(3) යම් තැනැත්තකුට විරුද්ධව මේ පනත යටතේ නඩු පවරනු ලැබිය හැකි, මේ පනත යටතේ වූ වරදක් කරනු ලැබ ඇතැයි අධිකාරියට පෙනී යන්නා වූ ද පැමිණිලි කරන ලද වරද වෙනත් යම් තැනැත්තකුගේ ක්‍රියාවක් හෝ පැහැර හැරීමක් නිසා සිදු වූ බවට හා පළමුවෙන් සඳහන් කරන ලද තැනැත්තාට මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ නිදහසට කරුණක් තහවුරු කළ හැකි බවට එම අධිකාරිය යුක්ති සහගත ලෙස සෑහීමට පත්වන්නා වූ ද අවස්ථාවක, පළමුවෙන් සඳහන් කරන ලද තැනැත්තාට විරුද්ධව පළමුව නඩු පැවරීමට නොසලස්වා ඒ වෙනත් තැනැත්තාට විරුද්ධව නඩු පැවරීමට සැලැස්වීම, අධිකාරිය විසින් කරනු ලැබිය හැකි ය.

එවැනි යම් නීති කෘත්‍යයක දී පළමුවෙන් සඳහන් කරන ලද තැනැත්තාට විරුද්ධව චෝදනා කළ හැකි වූ වරද සම්බන්ධයෙන් විත්තිකරුට විරුද්ධව චෝදනා කරනු ලැබිය හැකි ය; තව ද වරද සිදු වූයේ විත්තිකරුගේ ක්‍රියාවක් හෝ පැහැර හැරීමක් නිසා යයි ඔප්පු කරනු ලැබූ විට, ඔහු වරදකරු කරනු ලැබිය හැකි ය.

නිදහසට කරුණ.

30. (1) (2) වන උපවගන්තියට යටත්ව, මේ පනතේ හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගවල විධිවිධානවලට පට හැණිව විලවුන්, උපකරණ හෝ ඖෂධ විකිණීමේ වරද පිළිබඳ නඩු පැවරීමක දී—

(අ) ඇසුරුමක වූ විලවුන්, උපකරණ හෝ ඖෂධ තමා විසින් මිලට ගනු ලැබ, එම ඇසුරුම පිටින් ම හා තමා එය මිලට ගත් අවස්ථාවෙහි එය පැවැති තත්ත්වයෙන් ම තමා විසින් එය විකුණනු ලැබූ බව; හා

(ආ) ඒ විලවුන්, උපකරණ හෝ ඖෂධ විකිණීම, පනත හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝග හෝ කඩ කිරීමක් වෙතැයි නැතහොත් උල්ලංඝනය කිරීමක් වෙතැයි තමාට යුක්ති සහගත උද්‍යෝගයකින් යුතුව නිසැකව දැන ගැනීමට නුපුළුවන් වූ බව

විත්තිකරු සඳහා වූ නිදහසට කරුණක් විය යුතු ය.

(2) වරද අනාවරණය කරනු ලැබීමෙන් දින තිහක් ඇතුළත විත්තිකරු විසින්, වරද අනාවරණය කළ බලයලත් නිලධරයා වෙත—

(අ) තමා ඒ නිදහසට කරුණ ආධාර කරගැනීමට අදහස් කරන බව; සහ

(ආ) ඒ විලවුන්, උපකරණ හෝ ඖෂධ තමා මිලට ගත්තේ යම් තැනැත්තකුගෙන් නම් ඒ තැනැත්තාගේ නම හා ලිපිනය සහ මිලට ගත් දිනය

ලියවිල්ලකින් දන්වනු ලැබ ඇත්නම් මිස, (1) වන උපවගන්තියේ සඳහන් නිදහසට කරුණ විත්තිකරුට නොලැබිය යුතු ය.

අනුමත කරන ලද විශ්ලේෂකයකුගේ හෝ අතිරේක අනුමත කරන ලද විශ්ලේෂකයකුගේ වාර්තාව හෝ සහතිකය.

31. (1) පරීක්ෂණය හෝ විශ්ලේෂණය සඳහා තමා වෙත ඉදිරිපත් කරන ලද යම් කාරණයක් පිළිබඳ වූ, අනුමත කරන ලද විශ්ලේෂකයකු හෝ අතිරේක අනුමත කරන ලද විශ්ලේෂකයකු විසින් අත්සන් කරන ලද වාර්තාවක් හෝ සහතිකයක් වශයෙන් අදහස් කෙරෙන ලේඛනයක්, පටහැණි සාක්ෂි නොමැති විටක, එහි ප්‍රකාශිත කරුණු පිළිබඳව ප්‍රමාණවත් සාක්ෂියක් විය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් වාර්තාවක් හෝ සහතිකයක් තමාට විරුද්ධව ඉදිරිපත් කරනු ලැබූ පාර්ශ්වකරුවකු අවස්ථාවෝචිත පරිදි, අනුමත කරන ලද විශ්ලේෂක හෝ අතිරේක අනුමත කරන ලද විශ්ලේෂකයකු හෝ සාක්ෂිකරුවකු වශයෙන් කැඳවිය යුතු යයි ඉල්ලා සිටින විට ඔහු කැඳවීමේ වියදම්

අධිකරණය වෙත ඒ පාර්ශ්වකරු විසින් ගෙවනු ලැබීම මත අධිකරණය විසින් ඔහු කැඳවනු ලැබ සාක්ෂිකරුවකු වශයෙන් විභාග කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියෙහි සඳහන් වාර්තාව හෝ සහතිකය ඉදිරිපත් කිරීමට අදහස් කරන පාර්ශ්වකරු විසින්, එය ඉදිරිපත් කිරීමට අදහස් කරන්නේ යම් පාර්ශ්වකරුවකුට විරුද්ධව ද ඒ පාර්ශ්වකරු වෙත ඒ වාර්තාවේ හෝ සහතිකයේ පිටපතක් දෙනු ලැබ ඇත්නම් සහ එය ඉදිරිපත් කිරීමට තමන් අදහස් කරන බවට යුක්ති සහගත දැනුම්දීමක් කර ඇත්නම් මිස ඒ වාර්තාව හෝ සහතිකය සාක්ෂි වශයෙන් භාර නොගත යුතු ය.

බලයලත් නිලධරයා විසින් තමා වෙත රඳවාගත් සැම්පලයේ කොටස අධිකරණයට ඉදිරිපත් කළ යුතු බව.

32. (1) බලයලත් නිලධරයකු විසින් ලබාගත් සැම්පලයක්, ඔහු විසින් කොටස්වලට බෙදීමට හා ඉන් එක් කොටසක් තමා වෙත රඳවා ගැනීමට නියමිත අවස්ථාවක, ඒ සැම්පලයට අදාළ නඩු පැවරීම කරනු ලබන අවස්ථාවේ දී ඔහු විසින් තමා වෙත රඳවා ගත් කොටස අධිකරණයට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ අධිකරණයෙහි දී ඉදිරිපත් කරන ලද සැම්පලයේ කොටස විශ්ලේෂණය හෝ පරීක්ෂණය සඳහා, ඒ සැම්පලයේ වෙනත් යම් කොටසක් විශ්ලේෂණය හෝ පරීක්ෂණය කළ විශ්ලේෂකයකු නොවන, අනුමත කරන ලද විශ්ලේෂකයකු හෝ අතිරේක අනුමත කරන ලද විශ්ලේෂකයකු වෙත ඉදිරිපත් කිරීම මහෙස්ත්‍රාත්වරයා විසින් තමාගේ ම මෙහෙයීමෙන් කරනු ලැබිය හැකි ය; නඩු පැවරීමට සම්බන්ධ යම් පාර්ශ්වකරුවකුගේ ඉල්ලීම පරිදි එසේ කරනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ සැම්පලයක කොටසක් ඉදිරිපත් කරන ලද්දේ යම් විශ්ලේෂකයකු වෙත ද ඒ විශ්ලේෂකයා විසින්, සැම්පලයේ ඒ කොටස ඔහුට ලැබුණු දිනයේ සිට දින විසි අටක් ඇතුළත ඔහුගේ වාර්තාව හෝ සහතිකය හෝ අධිකරණයට යවනු ලැබිය යුතු ය.

(4) විශ්ලේෂණයේ හෝ පරීක්ෂණයේ වියදම් අධිකරණය විසින් විධාන කරනු ලැබිය හැකි යම් පාර්ශ්වකරුවකු විසින් ගෙවනු ලැබිය යුතු ය.

බලයලත් නිලධරයකු විසින් ලේඛනයකින් ගත් පිටපතක් හෝ උධෘතයක්.

33. 22 (1) (ඇ) වගන්තිය යටතේ බලයලත් නිලධරයකු විසින් යම් පොතකින්, ලේඛනයකින් හෝ වාර්තාවකින් සාදන ලද පිටපතක් හෝ ගන්නා ලද උධෘතයක්, බලයලත් නිලධරයා විසින් සත්‍ය පිටපතක් හෝ උධෘතයක් වශයෙන් සහතික කරනු ලැබ ඇත්නම්, ඒ පොත, ලේඛනය හෝ වාර්තාව තබන හෝ පවත්වාගෙන යන තැනහොත් ඒ පොත, ලේඛනය හෝ වාර්තාව තැබීමට හෝ පවත්වාගෙන යෑමට සලස්වන තැනැත්තාට විරුද්ධව සාක්ෂි වශයෙන් ඇතුළත් කරනු ලැබිය යුතු අතර, ඒ පොතේ, ලේඛනයේ හෝ වාර්තාවේ අඩංගු දෑ පිළිබඳ බැලූ බැල්මට පෙනෙන සාක්ෂි විය යුතු ය.

34. (1) මේ පනතේ හා මේ පනත යටතේ සාදන ලද යම් නියෝගවල කාර්ය සඳහා— පූර්වානුමිති.

(අ) යම් සාප්පුවක හෝ භාණ්ඩ විකිණීම පිණිස සාමාන්‍යයෙන් යොදාගනු ලබන වෙනත් ස්ථානයක සොයා ගන්නා ලද, තබන ලද හෝ ප්‍රදර්ශනය කරන ලද යම් විලවුන් කිසි වක්, උපකරණයක් හෝ ඖෂධයක් විකිණීම සඳහා අදහස් කරන ලද බව පටහැණි තත්ත්වය ඔප්පු කරනු ලබන තෙක්, පූර්වානුමානය කරනු ලැබිය යුතු ය;

(ආ) විලවුන් හෝ ඖෂධ පිළියෙල කිරීමෙහි ලා පාවිච්චි කරනු ලබන ස්ථානයක තිබී සොයා ගන්නා ලද යම් විලවුන් කිසිවක් හෝ ඖෂධයක් සංයෝග කිරීම හෝ පිළියෙල කිරීම පිණිස යෙදිය හැකි යම් ද්‍රව්‍යයක් විලවුන් හෝ ඖෂධ සංයෝග කිරීම හෝ පිළියෙල කිරීම පිණිස යෙදීමට අදහස් කරන ලද බව පටහැණි තත්ත්වය ඔප්පු කරන තෙක්, පූර්වානුමානය කරනු ලැබිය යුතු ය.

(2) බාල කරන ලද ඖෂධයක් නිෂ්පාදනය කිරීමේ වරද සම්බන්ධයෙන් වූ නඩු පැවරීමක දී—

(අ) වෙනත් යම් ද්‍රව්‍යයක් එකතු කිරීමෙන් ඒ ඖෂධය බාල කරන ලද බව; හා

(ආ) විත්තිකරු, තම සන්තකයෙහි හෝ ස්ථානයෙහි ඒ වෙනත් ද්‍රව්‍යය තබාගෙන සිටි බව

ඔප්පු කරනු ලැබූ අවස්ථාවක, ඒ වෙනත් ද්‍රව්‍යය එකතු කිරීමෙන් ඒ ඖෂධය බාලකර ඇති බවට පටහැණි තත්ත්වයක් ඔප්පු කරන තෙක්, පූර්වානුමානය කරනු ලැබිය යුතු ය.

(3) යම් විලවුන් කිසිවක්, උපකරණයක් හෝ ඖෂධයක් අඩංගු ඇසුරුමක හෝ ඒ මත, එය නිෂ්පාදනය කළ හෝ ඇසුරු තැනැත්තාගේ නම හා ලිපිනය යයි අදහස් කෙරෙන නමක් හා ලිපිනයක් ඇති අවස්ථාවක, ඒ විලවුන්, උපකරණය හෝ ඖෂධය අවස්ථාවෝචිත පරිදි. නිෂ්පාදනය කරන ලද්දේ හෝ අසුරන ලද්දේ හෝ ස්වකීය නම හෝ ලිපිනය ඇසුරුම මත දක්වෙන තැනැත්තා විසින් යයි පටහැණි තත්ත්වය ඔප්පු කරන තෙක්, පූර්වානුමානය කළ යුතු ය.

35. මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදනු ලැබූ යම් නියෝගයක් යටතේ වූ වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් කරනු ලැබූ අවස්ථාවක දී,— පුද්ගල මණ්ඩලයක් විසින් කරනු ලැබූ වැරදි.

(අ) එම පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නම්, වරද සිදුකරනු ලැබූ වේලාවේ දී එම මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකු, සාමාන්‍යාධිකාරීවරයකු, ලේකම්වරයකු හෝ ඒ හා සමාන වෙනත් නිලධරයකු වූ සෑම තැනැත්තකු; හෝ

(ආ) එම මණ්ඩලය සංස්ථාවක් නොවේ නම්, වරද සිදුකරනු ලැබූ වේලාවේ දී එම මණ්ඩලයේ සාමාජිකයකු වූ සෑම තැනැත්තකු,

ඒ වරද සිදුකරනු ලැබුවේ තමාගේ කැමැත්ත හෝ එකහත්වය නොමැතිව බවත්, තමාගේ කර්තව්‍යයන්හි ස්වභාව අනුව අවස්ථානුගත කරුණුවල දී තමා ඒ වරද සිදු කිරීම වළක්වාලීමට කරනු ලැබිය යුතුව තිබූ සියලු කටයුතු නිසි උද්‍යෝගයෙන් ඉටු කළ බවත් ඔප්පු කරන්නේ නම් මිස, එම වරද සම්බන්ධයෙන් ඔහු වරදකරු බව සලකනු ලැබිය යුතු ය.

## IV වන කොටස

### සාමාන්‍ය කරුණු

සද්භාවයෙන් කරනු ලැබූ යම් ක්‍රියාවක් සඳහා ආරක්ෂාව.

36. මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදනු ලැබූ යම් නියෝග යටතේ යම් තැනැත්තකු විසින් සද්භාවයෙන් කරනු ලැබූ හෝ එසේ යයි අදහස් කරනු ලැබූ යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව යම් සිවිල් හෝ අපරාධ නඩුවක් පැවරීම හෝ වෙනත් නීති කෘත්‍යයක් කිරීම හෝ නොකළ යුතු ය.

විලවුන්, උපකරණ සහ ඖෂධ සම්බන්ධයෙන් වෙනත් ලිඛිත නීති අදාළ කිරීම.

37. (1) සුරාබදු ආඥාපනතේ අර්ථානුකූලව සුරාබදුවලට යටත් ද්‍රව්‍ය වන ඖෂධවලට අදාළව, මේ පනතේ සහ මේ පනත යටතේ සාදනු ලැබූ යම් නියෝගවල විධිවිධාන, එම ආඥාපනතේ විධිවිධාන වලට අතිරේක විය යුතු අතර එම ආඥාපනතේ විධිවිධාන වෙනුවට ආදේශ කෙරෙන විධිවිධාන නො විය යුතු ය.

(2) යම් විලවුන් කිසිවක්, උපකරණයක් හෝ ඖෂධයක් ආනයනය කිරීමට අදාළව මේ පනතේ සහ මේ පනත යටතේ සාදනු ලැබූ නියෝගවල විධිවිධාන බලගැන්වීමේ සහ එම විධිවිධාන කඩ කිරීම හෝ කඩ කිරීමට තැත් කිරීම වැළැක්වීමේ සහ ඊට දඬුවම් කිරීමේ කාර්ය සඳහා රේගු ආඥාපනතේ විධිවිධාන අදාළ විය යුතු ය.

(3) මේ පනත යටතේ ආනයනය කිරීම තහනම් කරනු ලැබූ යම් විලවුන් කිසිවක්, උපකරණයක් හෝ ඖෂධයක් කෙරෙහි රේගු ආඥාපනත අදාළ කිරීමේ කාර්ය සඳහා, ඒ විලවුන්, උපකරණය හෝ ඖෂධය එම ආඥාපනත යටතේ ආනයනය කිරීම තහනම් කරනු ලැබූ භාණ්ඩ වශයෙන් සලකනු ලැබිය යුතු ය.

නියෝග.

38. (1) නියම කරනු ලැබිය යුතු බවට මේ පනතෙහි නියමිත කරුණු සම්බන්ධයෙන් හෝ යම් කරුණු සම්බන්ධයෙන් නියෝග සෑදීම පිණිස බලය පවරනු ලැබ ඇත්නම් ඒ සම්බන්ධයෙන් හා විශේෂයෙන්, පහත සඳහන් සියලු කරුණු හෝ යම් කරුණක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින්, විලවුන්, උපකරණ සහ ඖෂධ පිළිබඳ තාක්ෂණික උපදේශක කමිටුව විමසීමෙන් පසුව, නියෝග සාදනු ලැබිය හැකි ය :—

(අ) යම් නියමිත ද්‍රව්‍යයක් හෝ ද්‍රව්‍ය වර්ගයක් යම් විලවුන් කිසිවක හෝ ඖෂධයක තිබේ නම් හෝ එවැන්නකට එකතු කර හෝ එවැන්නකින් නිස්සාරණය කර හෝ

එවැන්නකට නොයෙදා ඇත්නම් ඒ විලවුන් හෝ ඖෂධය හෝ ඒ විලවුන් හෝ ඖෂධ වර්ගය හෝ බාල කරන ලද බව ප්‍රකාශ කිරීම ;

(ආ) යම් විලවුන් කිසිවක්, උපකරණයක් හෝ ඖෂධයක් ලේබල් කිරීම සහ ඇසිරීම සහ විකිණීම පිණිස ඉදිරිපත් කිරීම, ප්‍රදර්ශනය කිරීම සහ ප්‍රචාරය කිරීම ;

(ඇ) යම් විලවුන් කිසිවක්, උපකරණයක් හෝ ඖෂධයක් පිළිබඳ ඇසුරුම් භාජනවල ප්‍රමාණය, දිග පළල, පුරවා ඇති ප්‍රමාණය සහ වෙනත් පිරිවිතර ;

(ඈ) පාරිභෝගිකයා හෝ ගැනුම්කරු යම් විලවුන් කිසිවක, උපකරණයක හෝ ඖෂධයක ගුණය, ස්වභාව, අගය, සංයුතිය හෝ ආරක්ෂා සහිත බව පිළිබඳව රවටනු ලැබීමෙන් හෝ නොමග යැවීමෙන් වළක්වාලීම හෝ පාරිභෝගිකයාගේ හෝ ගැනුම්කරුගේ සෞඛ්‍යයට හානි වීම වළක්වාලීම සඳහා යම් විලවුන් කිසිවක, උපකරණයක, හෝ ඖෂධයක සංරචකයක් වශයෙන් යම් ද්‍රව්‍යයක් භාවිත කිරීම ;

(ඉ) විලවුන්වල, උපකරණවල හෝ ඖෂධවල සංයුතියේ, ශක්තියේ, බලයේ, සංශුද්ධියේ, ගුණයේ හෝ වෙනත් ලක්ෂණයක ප්‍රමිති ;

(ඊ) පාරිභෝගිකයාගේ හෝ ගැනුම්කරුගේ සෞඛ්‍යයේ යහපත සඳහා හෝ පාරිභෝගිකයාට හෝ ගැනුම්කරුට හානි සිදුවීම වැළැක්වීම සඳහා හෝ යම් විලවුන් කිසිවක්, උපකරණයක් හෝ ඖෂධයක් පිළියෙල කිරීමේ, නිෂ්පාදනය කිරීමේ, ආරක්ෂා කිරීමේ, ඇසිරීමේ, ගබඩා කිරීමේ සහ පරීක්ෂා කිරීමේ ක්‍රමය ;

(උ) (i) මේ පනත යටතේ බලපත්‍ර ප්‍රදානය කරනු ලැබිය හැක්කේ හෝ ප්‍රතික්ෂේප කරනු ලැබිය හැක්කේ කවර තැනැත්තන්ට ද, කවර අවස්ථානුගත කරුණුවල දී ද සහ කවර නියමයන් හා කොන්දේසි මත ද යන වග ;

(ii) මේ පනත යටතේ බලපත්‍ර සඳහා ඉල්ලීම් කරනු ලබන සහ ඒවා පිළිබඳව ක්‍රියා කරනු ලබන ආකාරය සහ ක්‍රමය ; සහ

(iii) බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා ගෙවිය යුතු ගාස්තුව ;

(ඌ) මේ පනත සහ ඒ යටතේ සාදනු ලැබූ නියෝග නිසි පරිදි බලාත්මක කිරීම සහ පරිපාලනය කිරීම සඳහා අවශ්‍ය යයි අමාත්‍යවරයා සලකන යම් තොරතුරු සැපැයීමට සහ යම් පොත් සහ වාර්තා පවත්වාගෙන යාමට, යම් විලවුන්, උපකරණ හෝ ඖෂධ නිෂ්පාදනය කරන හෝ විකුණන තැනැත්තන්ට නියම කිරීම ;

(එ) මේ පනතේ සහ මේ පනත යටතේ සාදනු ලැබූ නියෝගවල කාර්ය සඳහා භාවිත කළ යුතු ආකෘති;

(ඒ) යම් බාල කරන ලද විලවුන් කිසිවක් හෝ ඖෂධයක් විකිණීම හා විකිණීම සඳහා ප්‍රවාහනය කිරීම පිළිබඳ වූ තහනම් කිරීම් සහ සීමා කිරීම්;

(ඔ) යම් ඖෂධයක සැම්පල් බෙදාහැරීම සහ බෙදා හැරීමේ කොන්දේසි.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කිරීමේ දිනයෙහි හෝ නියෝගයෙහි නිශ්චිත ව සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනයක හෝ එය ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක් ම, එය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය.

(4) එසේ අනුමත නොකරනු ලැබූ යම් නියෝගයක්, ඒ යටතේ ඉහතින් කරනු ලැබූ කිසිවකට හානියක් නොමැති ව, එහි අනනුමතියේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු දිනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

ඉතිරි කිරීම.

39. 1980 ආහාර පනත මගින් ආහාර සහ ඖෂධ පනත ඉවත් කරනු ලැබුව ද, එකී පනත යටතේ සාදනු ලැබූ, මේ පනත ක්‍රියාත්මක වීමට පෙරාතුව ම බලපැවැත්වූ නියෝග මේ පනතේ විධිවිධානයන්ට අනනුකූල නොවන විට හා එසේ අනනුකූල නොවන පමණට මේ පනත යටතේ සාදනු ලබන නියෝගයන් මගින් වෙනස් කිරීම, සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලබන තාක් කල් නොකඩවා බලපැවැත්විය යුතු ය.

අර්ථ නිරූපණය.

40. පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

"බාල කරන ලද" යන්නෙන්, යම් ඖෂධයක හෝ විලවුන් කිසිවක ගුණය, සංයුතිය හෝ බලය කෙරෙහි බලපාන ලෙස, ඊට යම් ද්‍රව්‍යයක් එකතු කිරීම හෝ ඉන් එහි අඩංගු යම් ද්‍රව්‍යයක් අඩු කිරීම අදහස් වේ;

"ප්‍රචාරය කිරීම" යන්නට, යම් ඖෂධයක, විලවුන් කිසිවක හෝ උපකරණයක නිෂ්පාදනය, විකිණීම හෝ බෙදාහැරීම කෙළින් ම හෝ අනියම් ලෙස නංවාලීමේ කාර්ය සඳහා කවර වූ හෝ ක්‍රමයකින් නිදේශනය කිරීමක් ඇතුළත් වේ;

"විලවුන්" යන්නට, ශරීර වර්ණය, චර්මය, කෙස් හෝ දත් පිරිසිදු කිරීම, දියුණු කිරීම හෝ වෙනස් කිරීම පිණිස භාවිත කිරීම සඳහා නිෂ්පාදනය කරනු ලැබූ, විකුණනු ලැබූ හෝ නිදේශනය කරනු ලැබූ යම් ද්‍රව්‍යයක් හෝ ද්‍රව්‍යවල සම්මිශ්‍රණයක් ඇතුළත් වන අතර, ඊට නිර්ගන්ධක සහ සුවඳ විලවුන් ද ඇතුළත් වේ;

"දන්ත වෛද්‍යවරයා" යන්නෙන්, වෛද්‍ය ආඥාපනත යටතේ දන්ත වෛද්‍යවරයකු වශයෙන් තත් කාලයේ ලේඛනගත කරනු ලැබූ තැනැත්තකු අදහස් වේ;

"උපකරණය" යන්නෙන්—

(i) මනුෂ්‍යයකුගේ හෝ සතෙකුගේ රෝග, ආබාධ හෝ අසාමාන්‍ය කායික තත්ත්ව හෝ ඒවායේ ලක්ෂණ නිර්ණය කිරීම, ඒවාට ප්‍රතිකාර කිරීම, ඒවා සීන කිරීම හෝ වැළැක්වීම;

(ii) මනුෂ්‍යයකුගේ හෝ සතෙකුගේ ශරීර ක්‍රියාකාරිත්වය හෝ ශරීර ව්‍යුහය පුනරුත්ථාපනය කිරීම, නිවරද කිරීම හෝ වෙනස් කිරීම;

(iii) මනුෂ්‍යයන්ගේ හෝ සතුන්ගේ ගර්භිණී භාවය නිර්ණය කිරීම; හෝ

(iv) මනුෂ්‍යයන් හෝ සතුන් ගර්භිණී කාලය තුළ දී රැක බලා ගැනීම සහ ප්‍රසූත කිරීමේ දී සහ ඉන් පසු දරුවන් සහ පැටවුන් ඇතුළුව ඔවුන් රැක බලා ගැනීම

සඳහා භාවිත කිරීම පිණිස නිෂ්පාදනය කරනු ලැබූ හෝ විකුණනු ලැබූ යම් භාණ්ඩයක්, මෙවලමක්, පිරියතක් හෝ උපක්‍රමයක් ද, ඒවායේ යම් අංගෝපාංගයක්, කොටසක් හෝ උපාංගයක් ද අදහස් වන අතර, ඊට ප්‍රතිසන්ධිරෝධක උපකරණයක් ඇතුළත් වන නමුත්, ඖෂධයක් ඇතුළත් නොවේ;

"ඖෂධය" යන්නට—

(i) (අ) මනුෂ්‍යයකුගේ හෝ සතෙකුගේ රෝග, අසාමාන්‍ය කායික තත්ත්ව හෝ ඒවායේ ලක්ෂණ නිර්ණය කිරීම, ඒවාට ප්‍රතිකාර කිරීම, ඒවා සීන කිරීම හෝ වැළැක්වීම;

(ආ) මනුෂ්‍යයකුගේ හෝ සතෙකුගේ ඓන්ද්‍රිය ක්‍රියාකාරිත්වය පුනරුත්ථාපනය කිරීම, නිවරද කිරීම හෝ වෙනස් කිරීම

සඳහා භාවිත කිරීම පිණිස නිෂ්පාදනය කරනු ලැබූ, විකුණනු ලැබූ, විකිණීම පිණිස ඉදිරිපත් කරනු ලැබූ හෝ නිර්දේශනය කරනු ලැබූ යම් ද්‍රව්‍යයක් හෝ ද්‍රව්‍යවල සම්මිශ්‍රණයක්;

(ii) පේටන්ට් හා හිමිකාර පිළියෙල කිරීම් වන්නා වූ භාවිත කිරීම සඳහා සූදානම් කර, විශේෂ නාමයක් යටතේ හෝ ලාක්ෂණික ස්වරූපයකින් වෙළෙඳ පළෙහි තබා ඇති ඖෂධයක් හෝ ඖෂධ සංයෝගයක්

ඇතුළත් වන නමුත් ආයුර්වේද ඖෂධයක් හෝ ආයුර්වේද බෙහෙතක් හෝ හෝමියෝපති ඖෂධයක් හෝ හෝමියෝපති බෙහෙතක් ඊට ඇතුළත් නොවේ;

"ආණ්ඩුවේ රස පරීක්ෂකවරයා" යන්නෙන්, තත්කාලයෙහි ආණ්ඩුවේ රස පරීක්ෂක ධුරය දරන්නා වූ තැනැත්තා අදහස් වන අතර, 18 වන වගන්තියේ කාර්යය සඳහා හැර, යම් අතිරේක ආණ්ඩුවේ රස පරීක්ෂකවරයකු, නියෝජ්‍ය ආණ්ඩුවේ රස පරීක්ෂකවරයකු, ජ්‍යෙෂ්ඨ සහකාර ආණ්ඩුවේ රස පරීක්ෂකවරයකු හෝ සහකාර ආණ්ඩුවේ රස පරීක්ෂකවරයකු ඇතුළත් වේ ;

"සනීපාරක්ෂා රහිත තත්ත්වයන්" යන්නෙන්, විලවුන් කිසිවක් හෝ ඖෂධයක් කුණුවලින් හෝ අපවිත්‍ර ද්‍රව්‍යවලින් දූෂණය කළ හැකි හෝ එය සෞඛ්‍යයට හානිදායක කළ හැකි තත්ත්වයන් හෝ අවස්ථානුගත කරුණු අදහස් වේ ;

"ලේබලය" යන්නට ඖෂධය, විලවුන් හෝ උපකරණය අඩංගු භාජනයක් මත ලියා, මුද්‍රණය කර, ස්ටෙන්සිල් කර, ලකුණු කර, ඔබ්බා, මුද්‍රා තබා හෝ අමුණා ඇති යම් ටැග් කැබැල්ලක්, හං වඩුවක්, ලකුණක් හෝ රූපමය හෝ වෙනත් විස්තරාත්මක දෙයක් ඇතුළත් වේ ;

"ලේබල් කිරීම" යන්නට, ලේබලය සහ ඖෂධයට, විලවුන්වලට හෝ උපකරණයට අදාළ සහ ඒ සමග ඇති යම් ලිඛිත, මුද්‍රිත හෝ රූපමය දෙයක් ඇතුළත් වේ ;

"වෛද්‍ය වෘත්තිකයා" යන්නෙන්, වෛද්‍ය ආඥාපනත යටතේ වෛද්‍ය වෘත්තිකයකු වශයෙන් ලේඛනගත කරනු ලැබූ තැනැත්තකු අදහස් වේ ;

"ඇසුරුම" යන්නට, යම් ඖෂධයක්, විලවුන් කිසිවක් හෝ උපකරණයක් සම්පූර්ණයෙන් හෝ ඉන් කොටසක් හෝ අඩංගු කර, තබා හෝ අසුරා ඇත්තේ යම් දෙයක ද ඒ දෙය ඇතුළත් වේ ;

"විකුණයි" යන්නෙන්, මුදලට හෝ ණයට හෝ හුවමාරු කිරීමක් වශයෙන් හෝ එසේම තොග වශයෙන් නැතහොත් සිල්ලර වශයෙන් විකිණීමේ ක්‍රියාව අදහස් වන අතර, "විකිණීම" යන්නෙහි ඊට අනුරූප අර්ථයක් තිබිය යුතු ය ;

"පශු වෛද්‍යවරයා" යන්නෙන්, 1956 අංක 46 දරන පශු වෛද්‍ය සහ පශු වෛද්‍ය වෘත්තික පනත යටතේ පශු වෛද්‍යවරයකු හෝ පශු වෛද්‍ය වෘත්තිකයකු වශයෙන් ලේඛනගත කරනු ලැබූ තැනැත්තකු අදහස් වේ.

## "අ" උපලේඛනය

| නම | | සංක්ෂේපනය |
|---|---|---|
| ෆාමකෝපියා ඉන්ටර්නැෂනලිස් | ... | (පී. එච්. අයි.) |
| බ්‍රිටිෂ් ෆාමකෝපියා | ... | (බී. පී.) |
| ෆාමකෝපියා ඔෆ් ද යුනයිටඩ් ස්ටේට්ස් ඔෆ් ඇමරිකා | ... | (යූ. එස්. පී.) |
| ද බ්‍රිටිෂ් ෆාමසුටිකල් කෝඩෙක්ස් | ... | (බී. පී. සී.) |
| ද බ්‍රිටිෂ් වෙටරිනරි කෝඩෙක්ස් | ... | (බී. වී. සී.) |
| ද ජැපනිස් ෆාමකෝපියා | ... | (ජේ. පී.) |
| යුරෝපියන් ෆාමකෝපියා | | |

## "ආ" උපලේඛනය

ඉන්සියුලින්

ඉන්සියුලින් පරිපෑදන

පූර්ව පිට්යුටරි නිස්සාරක

විකිරණශීල සමස්ථානිකයෝ

## "ඇ" උපලේඛනය

මෞඛ්‍ය පරාන්ත්‍ර භාවිතය සඳහා වන සජීව බැක්ටීරියා

පරාන්ත්‍ර භාවිතය සඳහා අනු ජීවින්ගෙන් හෝ වයිරසයන්ගෙන් පිළියෙළ කරනු ලැබූ ඖෂධ

පරාන්ත්‍ර භාවිතය සඳහා වන මස්තු සහ ඊට සමාන ඖෂධ

පරාන්ත්‍ර භාවිතය සඳහා වන ප්‍රතිජේවක

## "ඈ" උපලේඛනය

සංවේදිතා බිම්බ සහ පෙති

## "ඉ" උපලේඛනය

විෂය අංකය :

1. තැලිඩෝමයිඩ්
2. ලයිසර්ජික් අම්ල ඩයිඑතිල් එමයිඩ් (එල්. එස්. ඩී.) හෝ එහි යම් ලවණයක්
3. එම්. එන්. ඩයිමිතයිල්ට්‍රිප්ටමයින් (ඩී. ඊ. ටී.) හෝ එහි යම් ලවණයක්
4. එන්. එන්. ඩයිමිතයිල්ට්‍රිප්ටමයින් (ඩී. එම්. ටී.) හෝ එහි යම් ලවණයක්
5. 4 මෙතිල්—2.5 ඩයිමිතොක්සිඇම්ෆිටමයින් (එස්. ටී. පී.) (ඩී. ඕ. එම්.) හෝ එහි යම් ලවණයක්

## "ඊ" උපලේඛනය

| | |
|---|---|
| ව්‍යග්‍රතාව | නිශා විමෝචනය |
| අනුබද්ධදාහය | ස්ථෞල්‍යය |
| ධමනි දෘඪතාව | ඉදිමුම් අවස්ථාව |
| ඇදුම | පරංගි |
| ආශ්‍ය රෝග | ප්ලූරසිය |
| රුධිර වසවීම | නියුමෝනියාව |
| කාංශතාව | ධූසර මජ්ජාප්‍රදාහය |
| පිළිකා | රහස |
| පීනස | රූමැටිසියා උණ |
| වලිප්පුව | රූමැටියාහ පර්වප්‍රදාහය |
| අවපීඩනය | ප්‍රතිරක්තතය |
| දියවැඩියාව | ලිංගික බෙලහීනතාව |
| ඩිප්තීරියාව | ලිංගික ඌනවර්ධිතතාව |
| ආර්තව රෝග | කෝටර දාහය |
| අපස්මාරය | වසූරිය |
| පිත්තාශ රෝග | ස්පර්මැටෝපියා |
| කෝෂ්ඨය | ආඝාතය |
| ග්ලවුකෝමා | පිටගැස්ම |
| ගලගණ්ඩය | තයිරොයිඩ් රෝග |
| හෘද රෝග | ගුණ්ඩිල දාහය |
| වර්ධිමය | ට්‍රැකෝමා |
| අධ්‍යාතතිය | ක්ෂය රෝගය |
| මත්දාතතිය | අර්බුද |
| ඉම්පෙටසිගෝ | ජඨර ආන්ත්‍රික කාණ්ඩයේ වූ ව්‍රණ |
| කීලිද්‍ර පරශ්ලථය | යෝනිදාහය |
| වකුගඩු රෝග | කාමරෝග |
| ලාදුරු | සුදු යාම |
| අක්මා රෝග | දිරවා යාම |
| ජංගම් අතත්වය | පරංගි (යෝස්) |
| ජීවම්ඡාව සහ වමනය කිරීමේ ගර්භිණී භාවය | |